ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය) - 2020

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේවගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකාවිගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවලව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යයක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 42 ඡේදය අනුව ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. එසේ වුවද අධිකාරියට අයත් ඉසුසු ලොරි රථය 2018 වර්ෂයේදී රු.3,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | අදාළවර්ෂයේදී මෙම ලොරි රථය අප අධිකාරියේ අලෙවි ව්‍යාපෘතියට අයත්ව පැවැති වත්කමක් බැවින් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණත් අලෙවි ව්‍යාපෘතියේ ගිණුම් තුළ එය නිරූපණය කර ඇති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 ඡේදය අනුව තාවකාලිකව අක්‍රියව ඇති දැනටමත් භාවිතා කරන දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සාධාරණ අගයන් පිළිබඳ විස්තර හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2017 වර්ෂයේදී අධිකාරියේ ක්ෂය ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය වෙනස්කර තිබූ අතර අධිකාරිය විසින් 2017 ජනවාරි 01 දිනට පැවති වත්කම්වලින් කොටසක් සඳහා පමණක් ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කර තිබුණි. මේ හේතුවෙන් ඇති වී තිබුණු ක්ෂය බලපෑම අතීතානුයෝගීව ගලපා තිබුණු නමුත් රු.10,851,120 කවත්කම්වලට අදාළ ක්ෂය ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශන ප්‍රතිස්ථාපනය කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරිය සතු වත්කම් සඳහා අදාළ ක්ෂය ගැලපීම් නිසි පරිදි සිදුකර ඇති බව සහ අලෙවි ව්‍යාපෘතිය සඳහා අදාළ වත්කම්වල ක්ෂය වීම් එම ව්‍යාපෘතියේ වගකිව යුතු අය විසින් ගලපා නොමැති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම්හි ස්ථාවර වත්කම් මිලදී ගැනීම රු.12,464,798 ක් වුවද, වර්ෂය තුළදී දේපළ පිරියත හා උපකරණ | 2021 වර්ෂයේ සිට මෙය නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර ඒ | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අත්පත්කර ගැනීම් රු.5,286,005 ක් වූයෙන් රු.7,178,793 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාල පරිච්ඡේදය තුළ අත්පත් කරගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම, එම වටිනාකමින් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මගින් ලබාගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම හා මුදලින් ගෙවීම් කරන ලද වටිනාකම යන විස්තර සටහන් ලෙස දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගත් රු.5,286,005 ක් වූ වත්කම් පිළිබඳව මෙකී අවශ්‍යතාවය අනුව විස්තර අනාවරණය කර නොතිබුණි. | අනුව 2021 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් අධිකාරියේ සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් රු.3,901,596 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 අවසන් ගිණුම තුළින් එය සම්පූර්ණයෙන්ම නිවැරදි කිරීමට කටයුතු කරන අතර එම නිලධාරිනියට රාජකාරි නිසි පරිදි ඉටු කරන ලෙසට උපදෙස් ලබාදී ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු අනාවරණය කළ යුතුවීම. |
| (ආ) සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් සේවකයින් දෙදෙනෙකු විසින් අධිකාරියට එරෙහිව පවරා තිබූ නඩු දෙකකට අදාළව එකතුව රු.1,605,294 ක් වන්දි වශයෙන් ගෙවීමට 2020 මාර්තු 12 දින අධිකරණය විසින් තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම වන්දි ගෙවා නොතිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් සකස් කළයුතු වීම. |

1.5.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| අධිකාරි බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීමාසහිත හදබිම සමූපකාර සමිතිය විසින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට අයත් අලෙවි ඒකකයෙහි භාවිතා කරමින් තිබුණු වටිනාකම තක්සේරු නොකළ මේස, පුටු, රාක්ක ඇතුළු ගෘහ භාණ්ඩ, පරිගණක හා එකතු කිරීමේ යන්ත්‍ර ඇතුළු විද්‍යුත් උපකරණ හා අලෙවි කටයුතු සඳහා භාවිතා කළ අනෙකුත් උපකරණ ආදී භාණ්ඩ ඒකක 204 ක් 2019 පෙබරවාරි 01 දින සිට සිය භාරයට ගෙන භාවිතා කරනු ලබන නමුත් එසේ භාණ්ඩ පැවරීම සඳහා අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතියක් නොතිබුණි. තවද ගැටඹේ සහ වැලිගම පිහිටි අලෙවි ගොඩනැගිලි පරිශ්‍ර ද සමූපකාර සංගමය විසින් භාවිතයට ගෙන තිබෙන නමුත් ඒ සඳහා ද අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතියක් නොතිබුණි. | 2017 මාර්තු 31 දිනැති කැබිනට් පත්‍රිකාව එවකට ආයතනය භාරව සිටි විෂයභාර අමාත්‍යවරයා විසින් හදබිම අධිකාරිය සතු දේපළ වත්කම්<br><br>හෝ මුදල් යෝජිත සමිතියට ලබා දෙන්නේ නම් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට තීරණය කරන ලද නමුත් එවැන්නක් සිදු වී නොමැත. එමෙන්ම අමාත්‍යවරයාගේ නියෝගය වන්නේ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පනවනු ලබන කාලයකට එම සමිතියට ඉහත කී වත්කම් දේපළ භාණ්ඩ භාරදිය යුතු බව වුවත් එයට පටහැනිව කටයුතු කර ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කළ යුතු වීම. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.28,605,445 ක් වූ අතර එයින් රු.5,054,805 ක් වසරක් ඉක්ම වූ ලැබිය යුතු ශේෂ විය. මෙම ශේෂ නිරවුල් කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු වීම. |

1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 09 ක එකතුව රු.9,645,041 ක් වූ අතර එයින් රු.5,732,336 ක් වසරක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂ විය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු ශේෂ නිරාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් රු.2,094,280 ක මුදලක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණු අතර එදිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශ අනුව හදබිම අධිකාරියෙන් 1989 වර්ෂයේ සිට රු.54,911,756 ක මුදලක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. මෙම වෙනසට හේතු සොයා බලා නිරාකරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | පොත්වලින් කපාහැරීම් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති බව. | ගනුදෙනුවලට අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ විෂයය පථය පුළුල් කිරීම හා නවීකරණය මැයෙන් 2017 මාර්තු 31 දින ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2017 අප්‍රේල් 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරමින් ලබාදී තිබුණු තීරණ | | | |
| (i) | අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කළ විද්වත් කමිටුවේ නිර්දේශ ගැසට් පත්‍රයක් මඟින් නියෝගයක් ලෙස ප්‍රකාශයට පත්කර එම ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | ගැසට් නිවේදනය නිකුත් කර පාර්ලිමේන්තුවට වාර්තා කර නොතිබුණි. | අදාළ ගැසට් පත්‍රය ඉදිරිපත් කර ඇති නමුත් එම ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත්තේද නැද්ද යන්න පිළිබඳව අපටද කිසිඳු සාක්ෂියක් ලැබී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළයුතුවීම. |
| (ii) | අධිකාරිය වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සහ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම. | සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණු නමුත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | පිළිගනිමි. | අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළ යුතුවීම. |
| (iii) | අලෙවි ප්‍රවර්ධන ඒකකය සමුපකාර සංගමයක් ලෙස ලියාපදිංචි කර සේවකයන් එම සමුපකාර සංගමයේ සේවකයන් ලෙස බඳවා ගැනීම. | සේවකයන් සමුපකාර සංගමයේ සේවකයන් ලෙස බඳවාගෙන තිබුණු නමුත් පසුව එනම් 2020 ජනවාරි 07 දින සිට | මෙම අලෙවිසැල 2019 පෙබරවාරි 01 දින සිට නීති විරෝධී ආකාරයට සී/ස හදබිම සමුපකාර සමිතිය නැමැති ආයතනයකට භාරදී තිබූ අතර මෙහි | අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවකයන් 12 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. | සඳහන් කර ඇති නිලධාරීන්ද එම සමිතියට අනුයුක්ත කිරීමෙන් පසු ඔවුන්ට එහි ස්ථිර පත්වීම් ලබාදී ඇත. එයට අනුව ඔවුන් අප අධිකාරියේ සේවකයන් ලෙස සැලකිය නොහැකි බැවින් ඒ සම්බන්ධව අප අධිකාරියට වගකීමක් පැවරී නොමැති බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------- | | | |
| i. | මුදල් රොගුලාසි 103 හා මුදල් රෙගුලාසි 110 | කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළ තුළ එකතුව රු.129,910 ක් වූ පැළ හානිවීම් ද,පල්ලේකැලේ ගොවිපළ තුළ රු.565,594 ක් වටිනා කුකුල් පැටවුන් හා වෙනත් සතුන් මියයෑම් හා බිත්තර අපතයන් ද සිදුවී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට පල්ලේකැලේ ගොවිපළ වෙත හානි හා පාඩු ලේඛන දෛනිකව යාවත්කාලීන කිරීමට හා මාසිකව හානි වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට ලිඛිත හා වාචික උපදෙස් ලබා දී ඇත. | හානි සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |
| ii. | මුදල් රෙගුලාසි 396හා 2016 ඔක්තෝබර් 06 දිනැති අංක 06/2016 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධව අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවධානය යොමු කළ යුතු වුවද බැංකු ගිණුම් දෙකකට අදාළ 2015 සිට 2019 වර්ෂය දක්වා වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු.1,030,720 ක් වූ චෙක්පත් 131 ක් | අවශ්‍ය පියවර ගනිමින් සිටින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් අදාළ කටයුතු කර නොතිබුණි. | | |
| iii. | මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල් ආදායම් හෝ බඩු බාහිරාදිය භාරව සිටින නැතහොත් ඒවා බෙදාහැරිමට සම්බන්ධවන හෝ පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් සහ රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ඇප තැබිය යුතු වුවද අධිකාරියේ තනතුරු 10 කට අදාළ නිලධාරීන් 23 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මේ වන විට ඇප අය කළ යුතු සියළු නිලධාරීන්ගෙන් ඇප අයකර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,059,573 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,173,377 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.886,196 ක වර්ධනයක් නිරීක්ෂණය විය.මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.61,196,209 ක් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | -------------- |
| (අ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළවල් දෙකෙහි සම්පූර්ණ අලාභය රු.9,933,656 ක් වී තිබූ අතර 2020 වර්ෂයේදී පිළිවෙලින් රු.3,496,573 ක් හා රු.4,503,158 ක අලාභ ලබා තිබුණි. 2015 මාර්තු 04 දිනැතිඅංක 04/04/07 දරන වාරිමාර්ග | ගොවිපළ දෙක සඳහා ව්‍යාපාරික සැලැසුම් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එහි අවශ්‍ය සංශෝධන සිදු කර වඩාත් ප්‍රායෝගික ව්‍යාපාරික සැලැසුමක් කඩිනමින් | විධිමත් ව්‍යාපාරික සැලැසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව එම ගොවිපළවල් දෙක සඳහා නිෂ්පාදනය සහ ආදායම් නිශ්චිතව හඳුනාගත් මාසික අනු බෙදීම් සහිතව්‍යාපාරික සැලැස්මක් සකස් කර ගොවිපළවල් ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණද 2020 වර්ෂය අවසන් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගොවිපළ වෙත සකස් කර අවසන් කිරීමට කටයුතු කරන බව. | |
| (ආ) | අලෙවි ව්‍යාපෘතිය යටතේ රු.5,568,974 ක් වැයකර 2014 වර්ෂයේදී ඉංගිරිය ප්‍රදේශයේ ඉදිකරන ලද අලෙවිසැල කිසිදු භාවිතයකින් තොරව 2020 වර්ෂයේදී ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණි. විධිමත් සැලැසුමකින් තොරව කටයුතු කිරීම එයට හේතුවී තිබුණි. | මේ වන විට සැලසුමකින් තොරව සහ ඉඩම් පවරා ගැනීමකින් තොරව අධිකාරිය හරහා ඉදිකිරීම් සිදු කිරීම නතර කර ඇති බව. | සැලැසුම් සහගත ලෙස කටයුතු කළ යුතු වීම. |

3.2 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොත්මලේ ගොවිපළ අක්කර 05 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර වගාවන් ලෙස පැළ තවාන්, එළවළු හා පලා බෝග වගාවන්, ගවපාලනය හා වෙළඳසැලක් පවත්වාගෙන යනු ලැබුවද අක්කර 03 ක් පමණක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර තිබුණි. | ගොවිපලේ පැළ නිෂ්පාදනය සඳහා අක්කර 3ක ප්‍රමාණයක් පමණක් ඇති බව පිළිගන්නා අතර මේ වර්ෂයේ සිට මෙතෙක් ප්‍රයෝජනයට නොගන්නා ලද අක්කර කිහිපයක් පැළ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට මේ වන විට කටයුතු සම්පාදනය කරමින් පවතින බව. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට පියවර ගත යුතු වීම. |

3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් ආයතන සතුව තිබුණු ඉඩම් විධිමත්ව පවරා නොගෙන අධිකාරිය විසින් දීර්ඝකාලීනව භාවිතය සඳහා ගොඩනැඟිලි ඉදිකරගෙන තිබුණි. මෙම ඉඩම්වල ඉකුත් වර්ෂයට පෙර වර්ෂවල දී රු.5,724,114 ක්ද, පෙර වර්ෂයේ දී රු.3,176,631 ක්ද, වටිනා ගොඩනැඟිලි ඉදිකර තිබුණු නමුත් ඒවායින් ඇතැම් ගොඩනැගිලි නිෂ්ක්‍රීයව පැවතුණි. කොත්මලේ ගොවිපලෙහි පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා රු.535,100 ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ ගොවිපලේ ඇති පැරණි අශ්ව ගාල කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | විධිමත්ව අධිකාරිය වෙත පවරා ගෙන නොතිබූ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, නිල නිවාසය, පල්ලේකැලේ සහ කොත්මලේ ගොවිපළ අධිකාරිය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1(ආ) මාර්ගෝපදේශය අනුව ඉදිකිරීම් කළ යුත්තේ ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසුවය. කෙසේ වුවද පවතින වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 71 අනුව ගොවිපලවල් සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් ස්ථාපිත නොකර හදබිම අධිකාරියට අනුමත වූ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකු යොදා ගෙන ගොවිපලේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. | පිළිගෙන ඇත. | අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවිය යුතු වීම. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.4 ඡේදය පරිදි ආයතනයේ පුහුණු අවශ්‍යතා ඇගැයීමට, ආයතනයේ ඉදිරි වෙනස්කම් වෙනුවෙන් සූදානම් වීමට සහ සේවක ඵලදායිතාව වර්ධනය කිරීම වෙනුවෙන් පුහුණු කමිටුවක් පත්කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු නමුත් පසුගිය වර්ෂ 05 තුළ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රු.3,702,821 ක් සැලැසුමකින් තොරව වැයකර තිබුණි. | පිළිගෙන ඇත. | පුහුණු අවශ්‍යතා ඉටු කිරීම සඳහා අරමුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 ඡේදය අනුව වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු වුවත් 2018 සහ 2019 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත කාලය තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගත විය යුතු වීම. |

4.2 තිරසර සංවර්ධන අරමුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 27 දිනැති අංක 08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් සහ ජාතික මට්ටමින් ළඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් නිලධාරීන් නම්කර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත යොමුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |